# මහින්ද චින්තන හා අභියෝග

මෙරට සිංහල ජනතාවගෙන් සියයට හැටකට වැඩි සංඛ්‍යාවක් මහින්ද චින්තන ජයග්‍රහණයකරවීම සඳහා ඡන්දය දුන්නේ විවිධ බලවේග පරාජයකිරීමට පමණක් නො වෙයි. අළුත් මාවතක ගමන්කිරීමේ බලාපොරොත්තුව ද ඔවුන්ට වෙයි. එහෙත් ඒ මාවත හරහා බැඳි බාධක රාශියකි. ඒ බාධක ජයගැනීම අද මහින්ද රාජපක්ෂ මහතාගේ කාර්යභාරය වෙයි. ඒ බාධක මැඩගෙන ඉදිරියට යෑම ඒ මහතාට පමණක් කළහැකි දෙයක් නො වෙයි. එයට ජනතාවගේ නොමඳ සහාය අවශ්‍ය වෙයි. ඒ බාධක ඇතිකෙරෙන්නේ විජාතික බලවේග හා ඔවුන්ගේ නියෝජිතයන් විසින් ය. අද ක්‍රියාත්මකවන විජාතික බලවේග හා නියෝජිතයන් ටික දෙනකු හෝ හඳුනාගත යුතු වෙයි. ගිය සතියේ අපි පඬියන් ගැන කතාකෙළෙමු. මේ පඬියන් ඒකීය රාජ්‍යයට විරුද්ධ බැව් ද අපි සඳහන්කෙළෙමු. බටහිර මතවාදවල හිරකරුවන් වූ මොවුන්ට ගතහැකිවනුයේ සීමාසහිත පියවර ය, එහෙත් ඒ පියවරවලට ඉඩදුනහොත් කල්යෑමේ දී මහා විනාශයක් වීමට ඉඩ ඇත. නියපොත්තෙන් කැඩියහැකි දේ පසුව පොරවෙන් ද කැපීමට නොහැකිවීමට ඉඩ ඇත.

පළමු බාධකය හිටපු ජනාධිපතිනිය වෙයි. ඇයත් ඇගේ සොහොයුරාත් මහින්ද රාජපක්ෂ මහතාට සහාය නොදුන්නා නොව ඒ මහතාගේ ජයග්‍රහණයට අකුල් හෙළූහ. එහෙත් ඇය තවමත් ශ්‍රී ල නි පක්ෂයේ සභාපතිනිය ය. ඇය හා ඇය වටා සිටින රාජ්‍ය නොවන සංවිධානවල කසිකබල් උගතුන් ද වෙනත් සිංහල විරෝධී දෙමළ ජාතිවාදීන් ද ගණනයකර තිබුයේ දෙමළ හා මුස්ලිම් ඡන්ද නොමැතිව ජයහග්‍රහණය නොකළහැකි බව ය. එපමණක් නොව නැගෙනහිර පළාතේ දෙමළ ජනතාවගේ ඡන්ද රනිල් වික්‍රමසිංහ මහතාට ලැබෙන පරිදි ඔවුන් කටයුතු කළ බව ද කියැවෙයි. මේ සියල්ලන්ගේ ගණනයකිරීම් වැරදි බව අපි කල්තබා ම ප්‍රකාශ කෙළෙමු. 1999න් පමණ පසුව මෙරට වත්මන් ජනසංයුතිය අනුව සියයට අසූවක් පමණ වූ සිංහල ජනයාගෙන් සියයට හැටක පමණ ඡන්දය ලබාගෙන ජයග්‍රහණය කළහැකි බව අප පෙන්වා දුන්නේ කලකට පෙර ය. 1977 පමණ සිට මුස්ලිම් දෙමළ ජනතාවගේ හඬට පමණක් ඇහුම්කන් දීමට ජේ ආර් ජයවර්ධන මහතාගේ සිට දේශපාලනඥයන් සූදානම් ව සිටි බව සැබෑ ය. ඔවුහු සිංහලයන්ගේ මතයට සවන් නො දුන්හ. එහෙත් අද ඒ තත්ත්වය වෙනස් වී ඇත. සිංහලයන්ගේ මතයට කන් නො දෙන අයකුට, ජාතිකත්වය නොසලකන අයකුට හෝ පක්ෂයකට හෝ අද ජනාධිපතිවරණයකින් හෝ පාර්ලිමේන්තු මැතිවරණයකින් හෝ ජයග්‍රහණය කළහැකි නො වෙයි. බැරි මරගාතයෙන් හෝ රනිල් වික්‍රමසිංහ මහතාට ද ජාතිකත්වයක් ආරූඪකරගැනීමට සිදුවිය. කුමාරතුංග මහත්මියගේ ආධාරකරුවන් වූ සිංහල විරෝධීන් ද දෙමළ ජාතිවාදයේ රාවය වූ සතිඅන්ත පත්තර කඩමාළු ද වෙනත් දෙමළ ජාතිවාදීන් ද පවසනු ඇත්තේ කොටි සංවිධානය ඡන්දයදැමීමට ඉඩ දුන්නේ නම් වික්‍රමසිංහ මහතා ජයග්‍රහණයකිරීමට තිබුණු බව ය. එහෙත් මොවුන්ට අමතකවන කරුණක් වෙයි. එනම් ශ්‍රී ල නි පක්ෂය කුමාරතුංග මහත්මිය යන සාධකය හේතුවෙන් ඡන්ද ව්‍යාපාරයෙහි දී එතරම් බරක් නොදැරූ බව ය. යම් අයුරකින් ශ්‍රී ල නි පක්ෂ යන්ත්‍රණය නිසි පරිදි ක්‍රියාත්මක වූණි නම් කොටි මැතිවරණය වර්ජනය නොකළද රාජපක්ෂ මහතා ජයගැනීම සහතික විය. කෙසේ හෝ කුමාරතුංග මහත්මියගේ අභිලාෂයට පිටින් මහින්ද රාජපක්ෂ මහතා ජයගෙන ඇත.

කුමාරතුංග මහත්මිය පරාජයෙන් පසු කළයුතුව තිබුණේ නම්බු පිටින් ගෞරවනීය ව ජනාධිපති මැදුරෙන් පිට වී යෑම ය. එහෙත් ඇගේ ලජ්ජා නැතිකම තම සීයාගේ මහමුදලිකමටත් වඩා ලොකු ය. අද ඇය ජීවත්වීම සඳහා රජයේ වියදමින් රම්‍ය සුරම්‍ය සුභ ආකාරයෙන් මන්දිර සොයන අතර ජනාධිපතිවරයාටත් නැති ආකාරයෙන් වෙඩි නොවදින වාහන පෙළක් ම තබාගැනීමට සැරසෙයි. එයට අමතරව ආරක්ෂාවට විශාල පිරිසක් රජයේ වියදමෙන් තබාගනියි. මේ අතර ජනාධිපති පදවියෙන් ඉවත්වීමට ටික දවසකට පෙර රුපියල් කෝටි ගණනක චෙක්පත් ජනාධිපති අරමුදලින් තමා සම්බන්ධ ආයතනවලට නිකුත්කර තිබූ බව වාර්තා විය. ජනාධිපතිනිය වශයෙන් සිටි අවසන් කාලයේ මුදල් සම්බන්ධ ගිවිසුම් රාශියක් ම අත්සන් කළ බව ද පැවසෙයි. ඇය ඇගේ ම වචනවලින් කියන්නේ නම් ශත පහක්වත් සොරකම් නොකරන්නට ඇත. එහෙත් කොමිස් ගණුදෙනු කෙරෙන්නේ ශතවලින් නොව රුපියල් කෝටි ගණන්වලින් බව අපි මතක්කරදෙමු. කුමාරතුංග මහත්මිය තව තවත් බලයේ රැඳී සිටීමට ආශාවක් පළකරන බව දේශපාලනය ගැන උනන්දුවක් දක්වන්නනට රහසක් නො වෙයි. ඇගේ බලාපොරොත්තු එකක් නොව කිහිපයක් ම ඇත. ඇගේ එක් බලාපොරත්තුවක් වනුයේ ඇයට මින් මතුවට ව්‍යවස්ථානුකූල ව විධායකු ජනාධිපති ධුරය දැරීමට නොහැකි බැවින් ඒ පදවිය අහෝසිකිරීම ය. කෙටි කාලයක් තුළ විධායකු ජනාධිපති ධුරය අහෝසිකර ඉන්පසු විධායකු අගමැති ධුරයක්

© Prof. Nalin De Silva

ඇතිකර එතැනට පැණ ගැනීමට ඇයට අවශ්‍ය වී ඇතිබව පැහැදිලි ය. අද අවලංගු කාසියක් බවට පත්වී ඇති කුමාරතුංග මහත්මිය ශ්‍රී ල නි පක්ෂයට ද රටට ද මහා බරක් වී ඇත. වහාම ඇය ශ්‍රී ල නි පක්ෂ නායකත්වයෙන් ඉවත්කිරීම පක්ෂයේ මෙන්ම රටේ ද යහපතට හේතුවෙයි. රටේ නායකයා බවට පත්වී ඇති රාජපක්ෂ මහතා ශ්‍රී ල නි පක්ෂයේ නායකයා බවට ද පත්කරගැනීමට පක්ෂයට ප්‍රශ්නයක් නොවිය යුතු ය.

මහින්ද රාජපක්ෂ මහතා සිංහල බෞද්ධ පරමාදර්ශී නායකයකු යැයි අපි නො කියමු. මෙරට බුද්ධ ශාසන අමාත්‍යාංශය ඒ මහතා විසින් අහෝසි කෙරී ඇත. අන්‍යාගමික අමාත්‍යාංශ ද ඒ සමග ඉවත්කෙරිණි යැයි පඬියකු පැවසීමට ඉඩ ඇත. එහෙත් මෙරට ව්‍යවස්ථාවෙහි බුද්ධ ශාසනය රැකීම පිළිබඳ වගන්තියක් වෙයි. ඒ වගන්තිය අහම්බෙන් ලියැවුණු එකක් නොවන බව කසිකබල් ඇංකර පඬියන්ට මතක්කර දිය යුතු ය. දුටුගැමුණු රජතුමාගේ කාලයේ සිට ම ඒ බව මෙරට අලිඛිත ව්‍යවස්ථාවෙහි විය. උඩරට ගිවිසුම ලෙස හැඳින්වෙන සිංහල බ්‍රිතානි ගිවිසුමෙහි බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා බුද්ධාගම ආරක්ෂාකිරීමට පොරොන්දු වූයේ එය මෙරට රාජ්‍ය පාලකයන්ගේ වගකීමක් වූ බැවින් ය. රාජපක්ෂ මහතාගේ කැබිනට්ටුවේ සාමාජිකයන් වූ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මහතා ආදී කතෝලික ඇමතිවරු ද, සිංහල කතෝලිකයන්ගෙන් බහුතරය ද මෙරට බුදු සසුනට හිමි තැන පිළිබඳ මනා අවබෝධයකින් පසුවෙති. ඔවුන් එයට විරුද්ධ නැත. සමානත්වය ගැන කතාකරන කසිකබල් පඬියන්ට බ්‍රිතානියේ හා ඇමරිකාවේ ඇංග්ලිකන් ක්‍රිස්තියානියට හිමි තැන ද, නෝර්වේ නම් රටෙහි ලූතරවාදී ක්‍රිස්තියානියට හිමි තැන ද පමණක් මතක්කරමු. ඉන්දීය ව්‍යවස්ථාවෙහි කෙසේ තිබුණ ද එරට හින්දු රටක් වෙයි. ඒ බව නොදන්නේ මෙරට විශ්ව විද්‍යාලවල දේශපාලන විද්‍යාව උගන්වන අනුකාරක ඇංකරයන් හා එවැනි වෙනත් අය පමණකි.

රාජපක්ෂ මහතාට මෙරට සියල්ලන්ගේ ම ජනාධිපති බව සැබෑ ය. බ්‍රිතානියේ එලිසබෙත් වින්ඩ්සර් මහත්මිය ද එරට සියල්ලන්ගේ ද, මෙරට ඇතැමුන්ගේ ද රැජින ය. එහෙත් ඇයට ඇංග්ලිකන් ක්‍රිස්තියානියේ නායිකාව මෙන් ම ආරක්ෂිකාව ද වීමට එය බාධාවක් නො වෙයි. ඇමරිකාවේ බුෂ් මහතා ක්‍රිස්තියානි මූලධර්මවාදියකු පමණක් නොව ක්‍රිස්තියානිය වෙනුවෙන් දෙවියන් වහන්සේ කී බව ප්‍රකාශකරමින් ඉරාකය ආක්‍රමණය කළ තැනැත්තෙක් ද වෙයි. එහෙත් මේ සියළු බටහිරයෝ අපට සමානත්ව බයිලා කියති. පසුගිය දා ක්ලින්ටන් මහතා මෙරටට පැමිණියේ ය. එය සුනාමි ගමනක් පමණක් යැයි අපි විශ්වාස නො කරමු. ඔහු ලංකාවට මෙන් ම ඉන්දුනීසියාවට ද ගිය බව සැබෑ ය. එහෙත් ඔහුගේ ප්‍රධාන ඉලක්කය වූයේ නව ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ය. ඡායාරූපශිල්පීන් හා අනෙක් අය සිනහසෙන රාජපක්ෂ හා ක්ලින්ටන් මහත්වරුන්ගේ ඡායාරූපගෙන හා පුවත්පත්වලට නිකුත්කරන ප්‍රකාශ සටහන්කරගෙන ඉවත්ව යෑමෙන් පසුව ක්ලින්ටන් මහතා රාජපක්ෂ මහතාට කීවේ කුමක් ද? අපට වැදගත්වන්නේ අපට නොකියන කොටස මිස පුවත්පත්වලට කියන කොටස නො වෙයි. ක්ලින්ටන් මහතා පසුගිය වතාවක කොටි නියෝජිතයන් මුණගැසුණේ ඇමරිකා එක්සත් ජනපද (ජනපදය නො වේ) කොටි සංවිධානය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස නම්කර තිබිය දී ය. එවර ඇමරිකන් තානාපති කාර්යාලය පැවසුවේ ක්ලින්ටන් මහතා පැමිණියේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතයකු ලෙස මිස ඇමරිකන් පුරවැසියකු ලෙස නොවන බව ය!

මහින්ද රාජපක්ෂ මහතාට දැනට ම එවැනි බලපෑම් සිදුවෙද්දී සාමකාරයන් තම සුපුරුදු කාර්යය නැවතත් පටන්ගෙන ඇත. එක් ආයතනයක් බැංගලෝරයේ පැවැත්වෙන ඊනියා ගැටුම් නිරාකරණ සම්මේලනයකට වැඩමකිරීමට මෙරට භික්ෂූන්වහන්සේ කිහිප නමකට ආරාධනයකර ඇත. මේ ගැටුම් නිරාකරණය ඒකීය රාජ්‍යයට විරුද්ධව ය. භික්ෂූන්වහන්සේ ගැටුම් නිරාකරණයකිරීම පිළිබඳ ව බුදුන්වහන්සේගෙන් ඉගෙනගත් දෑ වෙයි. ගැටුම් නිරාකරණය සඳහා භික්ෂූන්වහන්සේ මෙරට ඉතිහාසය පුරා කටයුතුකර ඇත. ගැටුම් නිරාකරණයකිරීම සඳහා උන්වහන්සේ දුටුගැමුණු රජු යුද්ධයට යනවිට එතුමා සමග ද වැඩියහ. ගැටුම් නිරාකරණයකිරීමට ඇත්තේ බුදුන්වහන්සේ අංගුලිමාල දමනයෙහි දී අනුගමනය කළ ප්‍රතිපත්තිය පමණක් නො වෙයි. යුද්දෙට නැති කඩුව කොස් කොටන්නට දැයි පිරුළක් ඇත්තේ සිංහල බෞද්ධ රටෙහි බව ඉම්පැක්ට් සංවිධාන නොදන්නවා විය හැකි ය. මෙරට ඉම්පැක්ට් ඇතිකර ඇත්තේ බටහිරයන්ගෙන් මුදල් ලබන ඊනියා ඉම්පැක්ට් සංවිධාන නොව බුදු සසුන ය. රාජ්‍ය නොවන සංවිධාන ඒ බව ජනාධිපතිවරණයේ දී ද තේරුම්ගත් බවට සැකයක් නැත. එහෙත් ඔවුන්ට එදත් අදත් අවශ්‍ය ඒ වෙනස්කිරීම ය. මෙරට භික්ෂූන්වහන්සේගෙන් බහුතරය පිටරට සංචාරයක් සඳහා රට පාවාදෙන නොදෙන බව අපට සහතික ය.

© Prof. Nalin De Silva